www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරානයට එරෙහි එක්සත් ජනපද යුධ එලැඹුම නතර කරනු!

## Stop the US war drive against Iran!

**කර්තෘ මන්ඩලය විසිනි**
**2007 පෙබරවාරි 14**

ඉරානයට එරෙහි ප්‍රහාරයකට පදනම් දමමින් බුෂ් පරිපාලනය ගෙන යන මිලිටරි සහ දේශපාලනික ප්‍රකෝපකරනයන් ලෝක සමාජවාදී වෙබ් අඩවිය හෙලා දකී. වොෂින්ටන් යුධ උන්මත්තකයින්ගේ කෲරතර සහ වියරු සහගත යුධ එලැඹුමට විරුද්ධ වන ලෙස සියලු කම්කරු ජනයාගෙන් සහ ශිෂ්‍ය තරුන-තරුනියන්ගෙන් අපි ඉල්ලා සිටිමු. යුද්ධය වැලැක්වීමට නම්, දේශපාලන සංස්ථාපිතයට සහ අධිරාජ්‍යවාදය නියෝජනය කරන මහා ව්‍යාපාරිකයේ පක්ෂවලට නොබැඳුනු සහ ඒවායින් ස්වාධීන, දේශපාලනිකව සවිඥ්ඥානක පංති-පාදක ව්‍යාපාරයක් ගොඩ නැගිය යුතු ය.

මෙය මායාවන්හි සහ ආත්ම තෘප්තීන්හි ගැලී සිටිය යුතු කාලයක් නොවේ. ඇමරිකානු ජනතාව ඡන්දයකට ගොස් මැද පෙරදිග යුද්ධයට දැවැන්ත මහජන අප්‍රසාදයක් පල කොට යන්තම් මාස තුනක් ගිය තැන බුෂ් පරිපාලනය ඉරාකය තුල තම මිලිටරි මෙහෙයුම් උත්සන්න කරනවා පමනක් නොව අසල්වැසි ඉරානයට එරෙහිව නව යුද්ධයක් දෙසට ඉවබව නොමැතිව ඇදී යමින් සිටී.

සිද්ධීන්ගේ තානය වේගවත් වී ඇති බැව් නිසැක ය. ඉරානය සහ සිරියාව සමග සාකච්ඡා පවත්වන ලෙසට ඉරාක අධ්‍යන කන්ඩායම විසින් කරන ලද නිර්දේශයන් මැතිවරනය ඉක්බිත්තෙහි බුෂ් පරිපාලනය විසින් මුලුමනින්ම ඉවත ලීය. ඒ වෙනුවට ජනවාරි 10 වන දින බුෂ් තම "මහෝඝයී" නිවේදනය කරමින්, ඉරානය සහ සිරියාව ඉරාකය තුල එක්සත් ජනපද විරෝධී කැරලිකරුවන්ට අවි සහ පුහුනුව ලබා දෙන බවට චෝදනා කල අතර ඇමරිකානු මිලිටරිය එවන් ආධාරක ජාලයන් "සොය සොයා විනාශ කරන" බැව් ප්‍රකාශ කලේ ය. ලේශ මාත්‍ර සාක්ෂ්‍යයක් හෝ ඉදිරිපත් නොකොට, ඉරාකයට "ඇඟිලි ගසන" බව සහ ඇමරිකානු සොල්දාදුවන් ඝාතනය කිරීම සඳහා ආධාර කරන බව පවසමින් බුෂ් තන්ත්‍රයේ නිලධාරීන් පාපී මාධ්‍ය ජාලයක ආධාරය සහිතව ටෙහෙරානයට එරෙහි බියකරු චෝදනාවන්ගෙන් සමන්විත නිරන්තර හඬ තැලීමක් පවත්වා ගෙන යයි.

පසුගිය සතියේදී, අනන්‍යතාව අවිනිශ්චිත පෙන්ටගන් නිලධාරීන් පිරිසක් විසින් එක්සත් ජනපද මුර සංචාරයන්ට එරෙහිව යොදා ගැනුනු ඉරානයේ නිශ්පාදිත බෝම්බ කීපයක් "සාක්ෂ්‍ය" ලෙස ඉදිරිපත් කලහ. ඔවුන් සහ පරිපාලනය නිශ්චිතව කියා සිටියේ "ඉරාන ආන්ඩුවේ ඉහල මට්ටමේ අය" මෙයට සම්බන්ධිත බවයි. සාක්ෂ්‍ය ඉදිරිපත් කරන ලද මෙම පෙන්ටගන් නිලධාරීන්, ඔවුනගේ නම් ඉදිරිපත් නොකෙරුනු සහ වාර්තා නොකෙරුනු තත්වය යටතේ පමනක් මෙම කරුනු ඉදිරිපත් කිරීම මගින් පෙන්නුම් කෙරෙන්නේ ටෙහෙරානයට එරෙහි ව්‍යාජ යුද නිමිත්තක් සොයා යන ගමනේ ප්‍රයෝගකාරී ස්වභාවයයි. තව දුර පවසතොත්, බැග්ඩෑඩය තුල මෙම "සාක්ෂ්‍ය" ඉදිරිපත් කිරීමෙන් යන්තමින් පැය 48 ක් ගතවූ තැන, ඉරාක ෂියා සන්නද්ධ හමුදාවන්ට නාවික ප්‍රවාහනයෙන් ලැබෙන අවි පිලිබඳව ඉරාන ආන්ඩුවේ මැදිහත් වීමක් ගැන මිලිටරියට දැන ගන්නට කිසිවක් නැතැයි ඒකාබද්ධ මාන්ඩලික ප්‍රධානීන්ගේ සභාපති ජෙනරාල් පීටර් පේස් පිලි ගත්තේ ය.

කෙසේ වුව ද, ටෙහෙරානයට එරෙහි මෙම චෝදනාවන් මාධ්‍යයන් මගින් පුලුල්ව පුනරුච්චාරනය කෙරෙන අතර ඉන් වැඩි කොටසක් කැප කෙරෙනුයේ, සිව් වසරකට පෙරාතුව ඉරාකය ආක්‍රමනය සඳහා එක්සත් ජනපදය සිදු කල ධාවනයේදී තර්ජනාත්මක අවි සහ ත්‍රස්තවාදී සබඳතා සම්බන්ධයෙන් ගෙන ගිය ව්‍යාජ යුද උද්ඝෝෂනය ඉටු කල ක්‍රියා කලාපයට සමාන ද්‍රෝහී ක්‍රියා කලාපයක් ඉටු කරනු පිනිස ය.

ඉරානයට එරෙහි මෙම ප්‍රබන්ධයට සමාන්තරව, ඉරාකය තුල පිහිටි ඉරාන ආන්ඩුවේ කාර්යාලවලට කෙරෙන මිලිටරි කඩා පැනීම් සහ සන්නද්ධ කන්ඩායම් මගින් ඉරාන රාජ්‍ය තාන්ත්‍රිකයන් පැහැර ගෙන යාම් වලින් සමන්විත, විවෘත ප්‍රකෝපකරනයන් භූමියේ සිදු කෙරේ.

මේ අතර පර්සියන් බොක්ක තුල ඉතා වේගයෙන් මිලිටරිය වර්ධනය කරනු ලැබේ. පෙබරවාරි අවසන් වන විට යුද නැව් 50 කින් සමන්විත ඇමරිකානු නාවික සේනාංකයක් ප්‍රදේශය තුල රැඳවීමට නියමිත ය. මෙයට,

2003 මාර්තුවලින් පසු පලමු වරට, වාහක ප්‍රහාරක කන්ඩායම් දෙකක් අන්තර්ගත වේ. එයට තුන්වන කන්ඩායමක් ද එකතු වන බවට වාර්තා වේ. කලාපය පුරා වන යුද කඳවුරු ජාලයක ස්ථානගත කරන ලද යුද ගුවන් යානාවන්ගේ පිටු බලය ලබමින් ක්‍රෑස් මිසයිල සහ සිය ගනනක් යුද ගුවන් නැව් යොදා ගනිමින් දවසේ පැය විසි හතර පුරා බෝම්බ හෙලීමේ ධාරිතාව එක්සත් ජනපද මිලිටරියට ඇත. එක්සත් ජනපද මිලිටරි වත්කම් ආරක්ෂා කිරීමටත් ඉරාන ප්‍රතිප්‍රහාරයක් සිදුවිය හැකැයි තැති ගැනී සිටින තම කලාපීය සගයන්ට ඊට එරෙහිව ක්‍රියා කිරීමේ එක්සත් ජනපද හැකියාව තහවුරු කිරීමටත් “දේශානුරාගී කාල තුවක්කු හට කන්ඩායම්” වලින් සමන්විත මිසයිල නාශක පද්ධතීන් දැනටමත් ගල්ෆ් රාජ්‍යයන් තුල ස්ථාපනය කරමින් පවතී.

මෙම මිලිටරි සූදානම්වලට සමාන්තරව බලගතු රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාකාරකමක වොෂින්ටනය යෙදී සිටී. ඊජිප්තුව, සවුදි අරාබිය සහ ජෝර්දානය අන්තර්ගත කොට ගත් ඉරාන විරෝධී සන්ධානයක් ගොඩ නැගීමට මාන බලමින් බුෂ් තන්ත්‍රයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු රැසක් පසු ගිය සතිවල මැද පෙරදිග සිසැරූහ. ඉරානය තම න්‍යෂ්ඨික වැඩ පිලිවෙල අත් හැරීමට අසමත් වුවහොත් “දරුනු පියවර” ගන්නා බවට කලාපයේ සමීපතම ඇමරිකානු සගයා වන ඊශ්‍රායලය දැනටමත් තර්ජනය කොට ඇත.

ඉරාක ආක්‍රමනයේ මූලික පෙලැඹුම්කරු වන උප ජනාධිපති ඩික් චෙනීගේ සංචාරයන් සුවිශේෂී අර්ථභාරයක් දනවයි. සවුදි රජු මුන ගැසීමට පසු ගිය ඔක්තෝබරයේ දී ඔහු කල එක් දින සංචාරයෙන් පසු සවුදි තෙල් නිපැයුමේ අනවරත වර්ධනයක් ද ලෝක තෙල් මිලෙහි වැටීමක් ද සිදු විය. මෙය ඉරාන ආර්ථිකය දුර්වල කිරීමට තුඩු දුන්නා පමනක් නොව යුද්ධයේ ආර්ථික කම්පනය අඩු කිරීමට ද හේතු විය. ඉරානය පිලිබඳ එක්සත් ජනපද සැලසුම්වලට තම සමීප සගයන් වන ඕස්ට්‍රේලියාවේ සහ ජපානයේ සහාය ලබා ගනු වස් චෙනී මේ මාසයේ දී එම රටවල සංචාරය කිරීමට නියමිත ය.

යුද්ධයක් ප්‍රකුපිත කරනු වස් සෑම උත්සාහයක්ම ගනු ලැබේ. බුෂ් පරිපාලනයේ ජාතික ආරක්ෂක කවුන්සිලයේ ඉරානය සහ පර්සියානු ගල්ෆ් කලාපය පිලිබඳ හිටපු අධ්‍යක්ෂ හිලරි මැන් ලිව්ස්වීක් සගරාවට මෙසේ පැවසී යː “එකට එක කරනු වස් ඇමරිකාවට එරෙහිව යමක් කිරීම සඳහා ඉරානය පෙලඹවීමට කල හැකි සෑම ප්‍රකෝපකරනයක්ම සිදුකිරීමට ඔවුන් අදහස් කරයි.”

## චෙනීගේ “ඉරාන වර්ෂය”

මේ අතර *වොෂින්ටන් පෝස්ට්* පුවත්පත මෙසේ වාර්තා කරයිː “සමහර ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන් සෘජු මුනගැටුමක් පිලිබඳ අදහසට මෙතෙක් කැමැත්ත දක්වයිග වොෂින්ටනයේ සිටින එක් තානාපතිවරයෙකු කියා සිටියේ, මෑත රැස්වීමක දී උප ජනාධිපති චෙනීගේ ජාතික ආරක්ෂක උපදේශක ජෝන් හැනා විසින් බුෂ් පරිපාලනය 2007 වර්ෂය සලකනු ලබන්නේ “ඉරාන වර්ෂය” ලෙස යැයි පැවසූ විට තමා තිගැස්සුනු බවත් එමගින් එක්සත් ජනපද ප්‍රහාරයක් සැබැවින්ම සිදුවිය හැකි බව පෙන්නුම් කෙරුනු බවත්ය.”

මේ අතර සෙනෙට් සභාව තුල කනෙක්ටිකට් අසුන නියෝජනය කරන ඩිමොක්‍රැටික් පාක්ෂික ක්‍රිස්ටොපර් ඩොඩ් ඉරිදා පැවති රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවක දී පැවසුවේ ඉරානය සමග යුද්ධයට “කැමති අය නිශ්චිතව සිටිනා” බවයි.“ අතීතයේ දී අප දුටුවේ ඔවුන් කැමැත්තෙන් සිටියේ ඒ සඳහා සිද්ධියක් ගොඩ නැගීමට වැඩි යමකට නොවන බවයි.”

මීට සමානව *නිව්යෝර්ක් ටයිම්ස්* හි තීරු ලිපි ලියන්නෙකු වන පෝල් ක්‍රුග්මාන් ඉරානයට එරෙහි ප්‍රහාරයක් පිලිබඳ අනතුරු අගවමින් සඳුදා තීරු ලිපියක මෙසේ ලිවීයː “අවම වශයෙන් පවසතොත් පරිපාලනය තුල ඉතා බලගතු කන්ඩායමක් යුද්ධ කිරීමට මාන බලන බවක් පෙනෙන්නට තිබේ.”

බුෂ් පරිපාලනයේ විදෙස් පිලිවෙත් පිලිබඳ විස්තරයන් සහ අභ්‍යන්තර ගතිකයන් නාසි ජර්මනියේ හෝ අධිරාජ්‍ය ජපානයේ පැවති රාජ්‍ය යාන්ත්‍රනයන්ට වැඩි යමක් නොවන බැව් වඩ වඩාත් පෙන්නුම් කෙරේ. වොෂින්ටනයේ පිලිවෙත සුවිසල් ලෙස නිර්නය කරනු ලබන්නේ, මුලුමනින්ම පාහේ අනිවාර්ය කෙරී ඇති තවත් එක්සත් ජනපද ආක්‍රමනකාරී යුද්ධයක් නිර්මානය කරනු වස් බලයන් මෙහෙයවනු ලබන සාපරාධී, යුද උන්මත්තක කුමන්ත්‍රනකාරී නඩයක් විසින් බැව් වඩ වඩාත් ප්‍රත්‍යක්ෂ වේ.

එක්සත් ජනපදය ඉරාකයට එරෙහිව යුද්ධය කරා යන විට ජනාධිපති බුෂ් කියන්නට පටන් ගත්තේ ඉරානයට ක්ෂනිකව පහරදීමේ සැලැස්මක් එක්සත් ජනපදය සතුව නොමැති බවයි. බුෂ් පරිපාලනයේ ක්‍රියාවන්ට දිය හැකි වඩාත් ත්‍යාගශීලී අර්ථකථනය වනාහි ටෙහෙරානය බිය වැද්දීමෙන් තම සියලු අවශ්‍යතාවන්ට නතු කෙරෙන පරිදි ඉරාන තන්ත්‍රය මෙහෙයවා ගැනීමට එය බලාපොරොත්තු වන බවයි. කෙසේ නමුදු, ආරම්භක චේතනාවන් කුමක් වුව ද පහසුවෙන්ම අපාලිත තත්වයකට ඇද වැටී පූර්න මිලිටරි ගැටුමක් කරා තල්ලු වී යාමේ එය සතුවූ

තර්කනයක් මෙවන් මැරකමකට ඇතග තව දුර පවසතොත්, පසු ගිය සය වසර පුරා උතුරා ගලන සාක්ෂි කන්දරාව මගින් තහවුරු කෙරෙන්නේ බුෂ්ගේ අරමුනු දයාවෙන් දුරස්ථ බවයි. ධවල මන්දිරය තුල සහ ඇමරිකානු පාලක ප්‍රභුව තුල සිටින වඩාත් යුදවාදී තට්ටුන්වල අදහස් උච්චාරනය කරන නව යටත් විජිතවාදීන් විසින් එක්සත් ජනපද අධිකාරිත්වය යටතේ මැද පෙරදිග ප්‍රතිසංවිධානය කිරීමේ පුලුල් මූලෝපායක කොටසක් ලෙස ටෙහෙරානය තුල "තන්ත්‍ර මාරුවක්" සඳහා නිරන්තර පීඩනයක් යොදමින් සිටී.

ධවල මන්දිරය පාලනය කරන දක්ෂිනාංශික ස්ථරයේ අදහස් වඩාත් සමීපව පිලිබිඹු කරන වෝල් ස්ට්‍රීට් ජර්නල් හි අගහරුවාදා පලවූ කතුවැකියකින් ඉරානයට එරෙහි බුෂ් පරිපාලනයේ චෝදනා හොඳ තුරුම්පුවක් ලෙස පිලි ගනිමින්" විපාකයක් නොමැතිව ඇමරිකානුවන් මරා දැමීමට ඉඩ දිය නොහැකි බව දන්වා ටෙහෙරානයට පනිවුඩයක් යවන්" ලෙස එක්සත් ජනපදයට කැඳවුම් කරයි. "ඉරාන අවි කම්හල් සහ විප්ලවවාදී ආරක්ෂක නියාමකයන් එල්ල කොට කෙරෙන ප්‍රහාරයන්" ඇතුලු ක්ෂනික බෝම්බ ප්‍රහාරයක් සඳහා එය අයැද සිටී.

එක්සත් ජනපදයේ හිටපු ජාතික ආරක්ෂක උපදේශක ස්බිග්නීව් බ්‍ර්සෙසින්ස්කි උත්තර මන්ත්‍රී මන්ඩල විදේශ සබඳතා කොමිටියට පෙබරවාරි 1 දා ඉදිරිපත් කරන ලද තෙස්තමේන්තුව තුලින් සුදානම් කරමින් සිටින්නේ කුමක්ද යන්න පිලිබඳව බාධාකාරී අනතුරු ඇඟවුමක් මතු විය. බුෂ්ගේ පිලිවෙත් හේතුවෙන් එක්සත් ජනපදය ව්‍යසනයක් දෙසට ගමන් කරමින් සිටිතැයි පැවසූ බ්‍ර්සෙසින්ස්කි ඉරාකය තුල යුද්ධය "ඓතිහාසිකල මූලෝපායික හා සදාචාරාත්මක ව්‍යසනයක්" ලෙස හෙලා දුටුවේ ය. ඔහු තම අනාවැකි කෙලින්ම පල කලේ මෙසේ ය: "එක්සත් ජනපදය ඉරාකය තුල දිග් ගැසුනු ලේ වැකි ක්‍රියාවක පටලැවී දිගටම මඩ වගුරේ ගිලෙන්නේ නම්, මෙම කන්දෙන් පහලට රූටා යන ගමනේ අවසන් ගමනාන්තය ඉරානය සමග සහ ඉස්ලාම් ලෝකයෙන් වැඩිමනත් වූ කොටසක් සමග මුහුනට මුහුන ලා කෙරෙන සටනක් විය හැක."

බුෂ්ගේ සමස්ත "ත්‍රස්තයට එරෙහි යුද්ධය" පිලිබඳව බ්‍ර්සෙසින්ස්කි කල තියුනු විවේචනයකදී, ඉස්ලාමික මූලධර්මවාදයෙන් සහ අල් කයිඩා ව්‍යාපාරයෙන් එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට එල්ල වී ඇති තර්ජනය නාසි ජර්මනියෙන් සහ සෝවියට් රුසියාවෙන් එල්ල වූ තර්ජනයට සමාන කිරීමට දරන උත්සාහයන් "මිථ්‍යාමය ඓතිහාසික ප්‍රබන්ධයක්" ලෙස විස්තර කලේ ය. "ඉරානය අපි කේන්ද්‍රය කොට ගත් පුලුල් ඉස්ලාමික තර්ජනයක් සහිතව, කලාපය තුල දී ඇමරිකාව දැනටමත් යුද්ධයකට මැදිවී ඇතැයි තර්ක කරනු ලබන්නේ තමා විසින්ම ක්‍රියාවට දැමීමට නියමිත අනාගත වාක්‍යයක් ප්‍රවර්ධනය කරනු පිනිස යැයි" ඔහු ප්‍රකාශ කලේ ය. "නොපැහැදිලි, ප්‍රකෝපකාරී කතාව . . . හේතුවෙන් ඇමරිකානු විරෝධය වේගයෙන් වැපිරෙන අතර එක්සත් ජනපදය සහ ඉස්ලාමික ලෝකය අතර නව දිගු කාලීන ගැටුමක අනතුර වර්ධනය වේ."

බ්‍ර්සෙසින්ස්කි ඔහුගේ ප්‍රකාශයේ වඩාත්ම රූක්ෂ කොටසේ දී "ඉරානය සමග මිලිටරි ගැටුමක් සඳහා මවා පෑ හැකි වාතාවරනයක්" සංක්ෂිප්තව ඉදිරිපත් කලේ ය. එය මතු දැක්වෙන ආකාරයේ දෑ වලට සම්බන්ධිත ඒවා විය හැකැ යි ඔහු යෝජනා කලේ ය. "ඉරාකය තුල තම අරමුනු සපුරා ගැනීමේ දී ඇති වූ අසමර්ථතාව, ඒ පිටු පසින් එම අසමර්ථතාව සම්බන්ධයෙන් ඉරානය සතු වග කීම පිලිබඳ චෝදනා, ඉක්බිති ඉරානය තුල යම් ප්‍රකෝපකරනයකින් පසු සහ ඇමරිකාව තුල ත්‍රස්ත ක්‍රියාවකින් පසු ඒ සම්බන්ධයෙන් ඉරානයට එල්ලවන චෝදනා, අවසානයේ දී ඉරාකය, ඉරානය, ඇෆ්ඝනිස්ථානය සහ පකිස්තානය සිසාරමින් පැතිරෙන හා ගැඹුරුවන මඩ වගුරකට හුදෙකලාවූ ඇමරිකාවක් තල්ලු කර දමන "ආරක්ෂනශීලී" එක්සත් ජනපද මිලිටරි ක්‍රියාවකින් මේ සියල්ලේ කුලු ගැන්වීමක්."

ධවල මන්දිරය මෙම ක්‍රියා පිලිවෙල පමනක් අනුගමනය කරමින් සිටියා නොව ඉරානයට එරෙහිව යුද්ධයක් දියත් කිරීම සඳහා නිමිත්තක් ලෙස "ඉරාකය තුල යම් ප්‍රකෝපකරනයක් හෝ එක්සත් ජනපදය තුල ත්‍රස්ත ක්‍රියාවක්"- නිර්මානය කිරීමේ හැකියාව ද සහිතව සිටි බැව් බ්‍ර්සෙසින්ස්කි ඔහුගේ ප්‍රකාශය අතරවාරයේ දී යෝජනා කලේ ය. ඇමරිකානු රාජ්‍ය යන්ත්‍රයේ ඉහලම කවයන්හි දශක ගනනාවක අත්දැකීම් ඇති මිනිසෙකුගේ මෙම අදහස් වනාහි තම ක්‍රියාවන්ගේ දුර දිග යන ප්‍රතිඵල මුලුමනින්ම නොතකා ඉරානය සමග මිලිටරි ගැටුමක් දෙසට බුෂ් පරිපාලනය වේගයෙන් ගමන් කරන බව පෙන්නුම් කරන තියුනු ප්‍රකාශනයකි.

1980 ගනන් පුරා එක්සත් ජනපදයේ දිරි ගැන්වීමෙන් සහ සහායෙන් ඉරාකය ගෙන ගිය ඉරාක-ඉරාන ලේ වැකි ගැටුම දැනටමත් විඳ දරා ඇති ඉරාන ජනතාවට තම රට සමග කෙරෙන කවර හෝ යුද්ධයක් විසින් ක්ෂනිකව ඛේදනීය දූර් විපාක අත් කර දෙනු ඇත. 1945 දී එක්සත් ජනපදය විසින් ජපානයේ හිරෝෂිමා සහ නාගසාකි නගර අලු දූලි බවට පත් කිරීමෙන් පසු ප්‍රථම වරට න්‍යෂ්ටික ගිනි මැලයක අනාගත දසුන මතු කරමින් ඇමරිකානු සහ ඊශ්‍රායල ඉහල කවයන් තුල ඉරානයට එරෙහිව පරමානු බෝම්බ භාවිතයට ගැනීම සම්බන්ධයෙන් උද්යෝගිමත් සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.

කෙසේ නමුදු, ඉරාකයේ මෙන් තුන් ගුනයක ජනකායක්, එනම් දස ලක්ෂ 70ක් වෙසෙන රටකට එල්ල වන එක්සත් ජනපද ප්‍රහාරයක ඇගවුම් ඉරානයමත් ඉක්මවා ගමන් කරයි. අනිවාර්යයෙන්ම මෙම ගැටුම විසින් මැද පෙරදිග සහ ආසියාව පුරා ප්‍රගාඪ අස්ථාවරකාරක බලපෑමක් ඇති කරන අතර කලාපයේ දැවැන්ත බල ශක්ති සම්පත් සම්බන්ධයෙන් තීරනාත්මක තරගයක යෙදී සිටින ප්‍රධාන යුරෝපීය සහ ආසියානු බලයන් එම ගැටුමට ඇදී ඒමේ හැකියාව බලගතු ලෙස පවතී.

බුෂ් පරිපාලනයේ පැවැත්ම, පලමු හා දෙවන ලෝක යුද්ධයන් පැන නැගීමට තුඩු දුන් ඉවබව නොමැති ආක්‍රමනකාරී ක්‍රියාවන්ට බියකරු සමානත්වයක් දක්වයි. 1930 ගනන් වලදී, ජාත්‍යන්තර නීතිය මුලුමනින්ම උල්ලංඝනය කරමින් සහ නිර්ලජ්ජිතව ගොතන ලද බොරු හේතු මත පාදක වෙමින්, ජර්මනිය සහ ජපානය එක් රටකට පසු තවත් රටකට තම සේනාංකයන් යවනු ලැබුවේ එම රටවල ජනතාවන් ත්‍රස්ත කරමින් සහ රූකඩ තන්ත්‍රයන් අටවමිනි. මීට සමානව අද දින ලෝක දේශපාලනය, මුලු මහත් ලොවම යුද ගිනි මැලයකට සැනෙකින් ඇද දැමීම සඳහා කුමන දෙයක් හෝ කිරීමට පසුබට නොවන උන්මත්තකයින්ගේ සහ අහංකාරෝන්මාදයෙන් පෙලෙන්නන්ගේ ග්‍රහනයට හසුව ඇති බවක් වඩ වඩාත් පෙනෙන්නට තිබේ.

## ඇමරිකානු මිලිටරිවාදයේ මූලයෝ

කෙසේ නමුදු මෙම උන්මත්තකභාවයට අනිවාර්ය තර්කනයක් ඇත. එක්සත් ජනපද මිලිටරිවාදයේ පුපුරා යාමට යටින් ක්‍රියාත්මකවන හේතුන් සොයා ගත හැක්කේ ලාභ පද්ධතිය තුලම පවත්නා අති මූලික සහ විසඳිය නො හැකි පරස්පර විරෝධයන්, එනම් ලෝක ආර්ථිකය සහ යල් පිනූ ජාතික රාජ්‍ය පද්ධතිය අතරත් සමාජගත නිෂ්පාදනය සහ පුද්ගලික අයිතිය මත පදනම් වූ වෙලඳපොල අරාජිකත්වය අතරත් පවත්නා පරස්පර විරෝධයන්, ජය ගැනීම සඳහා පාලක ප්‍රභූන් දරන වියරු සහගත ප්‍රයත්නයන් තුල ය. කඩා වැටෙන ලාභ රේට්ටු සහ ගැඹුරුවන ගෝලීය ආර්ථික අර්බුදය විසින් අවසානයේදී මිලිටරිමය මාධ්‍යයන් මගින් පමනක් විසඳ ගත හැකි, වෙලඳපොල, ලාභ ශ්‍රමය සහ සම්පත් උදෙසා කෙරෙන නිර්දය තරගයකට ප්‍රධාන බලයන් තල්ලු කර දමයි.

එක්සත් ජනපදය තුල තරම් මෙම ක්‍රියාදාමයන් වඩාත්ම සංකේන්ද්‍රිත ප්‍රකාශනයක් අත් කර ගන්නා අන් තැනක් නොමැත. දෙවන ලෝක යුද්ධයෙන් පසු, යුද්ධයේ සහ අවපාතයේ දශක තුනකින් විනාශ වූ ලෝක ධනේශ්වර පර්යාය තම වියදමෙන් යලි පන ගන්වා ගැනීම සඳහා තමා සතුව තිබූ දැවැන්ත ආර්ථික සම්පත් යොදා ගැනීමට ඇමරිකානු පාලක පංතිය සමත් විය. අනතුරුව තම යුරෝපීය සහ ආසියානු තරගකරුවන්ට එරෙහිව ඇමරිකානු ආර්ථිකයේ ඇති වූ පසු බෑම, ලොව සුවිසල්ම නය දෙන්නාගේ තත්වයේ සිට ලොව සුවිසල්ම නය ගැති ජාතිය බවට පරිවර්තනය වීම මගින් මතුකර පෙන්වන අතර මේ හේතුවෙන් භූගෝලීය දේශපාලනයේ වඩාත්ම අස්ථාවරකාරක සාධකය බවට එක්සත් ජනපදය පරිවර්තනය වී ඇත. තම ආර්ථික දුබලතා සමහන් කර ගැනීම සඳහා දරන වියරු සහගත ප්‍රයත්නයේදී භූගෝලීය අධිපතිධාරියා ලෙස තමාට හිමි ස්ථානය රැකගනු වස් තමා සතු දැවැන්ත මිලිටරි බලය මත වොෂින්ටනය වඩ වඩාත් යැපෙමින් පවතී.

ඉරානයට එරෙහිව බුෂ් විසින් සූදානම් කෙරෙන යුද්ධය පිටු පසින් පවත්නා හේතුන් සමග ටෙහෙරානයට එරෙහිව එල්ල කෙරෙන න්‍යෂ්ටික අවි වැඩ පිලිවෙල පිලිබඳ චෝදනාවට හෝ ඉරාකය තුල කටයුතු වලට "මැදිහත්වීම්" පිලිබඳ චෝදනාවට කවර හෝ සබඳතාවක් නොමැත. 1979 දී තම හිතවත් සගයා වූ ෂා රේසා පාලවී බලයෙන් පහ කිරීමෙන් අනතුරුව වොෂින්ටනය විසින් ඉරානයට එරෙහිව ආර්ථික සම්බාධක පවත්වා ගෙන යද්දී ඉරානයට යුරෝපීය බලයන්, රුසියාව, චීනය, ජපානය හා ඉන්දියාව දෙසට හැරෙන්නට සිදු විය. සුවිශේෂිතව ඉරානය සතු බල ශක්ති සම්පත් සූරා කෑම සඳහා මෙම රටවල් ඉස්ලාමික ජනරජය සමග වාසි දායක ආර්ථික ගිවිසුම් අත්සන් කලහ. ආර්ථික වශයෙන් තම ආධිපත්‍යය ස්ථාපිත කර ගැනීමට අසමත් වූ තැන, සුවිසල් බවින් ලොව දෙවන තැන ගන්නා ස්වභාවික වායු තැන්පතුව ද තෙවන තැන ගන්නා තෙල් තැන්පතුව ද මත තම පාලනය තහවුරු කර ගනු වස් තම මිලිටරි මස් පිඩු යොදා ගැනීමට බුෂ් පරිපාලනය මාන බලයි.

බලගතුම දේශපාලනික වැරැද්ද වනුයේ එක්සත් ජනපදයේ හෝ ජාත්‍යන්තර පාලක කවයන්හි සිටින තාර්කිකව හා යුක්ති සහගතව සිතන මතන ස්ථරයන් විසින් ඉරානය සමග යුද්ධයකට රූටා යන මෙම ගමන වලක්වනු ඇතැයි විශ්වාස කිරීමයි. බ්‍ර්සෙසින්ස්කිගේ අනතුරු ඇගවුම විශ්වීය නිශ්ශබ්දතාවකින් පිලි ගනු ලැබූ ඇමරිකානු මාධ්‍යයන් සහ දේශපාලන සංස්ථාපිතය විසින් නැවත වරක් තහවුරු කරන්නේ ඉරානයට පහර දීමෙන් ලෝකය සමග රුසියානු රූලට් :සූදු විශේෂයක්-පරිවර්තක* ක්‍රීඩාවට සැරසෙන බුෂ් සහ ඔහුගේ සගයන් එයින් වැලැක්වීම සඳහා, නීති විරෝධී ඉරාක ආක්‍රමනයට කොල එලිය ලබා දුන් ඩිමොක්‍රැටිකයන් කිසිවක් නොකරන බවයි. ඉරාකයෙන් එක්සත් ජනපද හමුදා ඉවත් කර ගැනීමට සහ කලාපීය විසඳුමක් සඳහා සියලු ප්‍රධාන බලයන් සහභාගි කරවා ගැනීමට බ්‍ර්සෙසින්ස්කි විසින්ම කරන ලද යෝජනාව මූලික කරුනු වලට යොමු වෙයි. එවන් සැලැස්මක් මැද පෙරදිග තුල එක්සත් ජනපද

අධිරාජ්‍යවාදයට ඇති අධිකාරිය හීන කිරීමට අනිවාර්යයෙන්ම හේතු කාරක වන අතර එය ගෝලීය වශයෙන් ඇති අධිකාරය ද හීන කිරීමට බලපාන බැවින් ඇමරිකානු පාලක ප්‍රභූවට මෙය කිසිසේත්ම පිලි ගත නොහැක.

යුරෝපා සංගමය, රුසියාව, චීනය හෝ එක්සත් ජාතීන්ගේ සංවිධානය බුෂ් පරිපාලනයේ යුද එලැඹුමට තිරිංග ලෙස ක්‍රියාත්මක වෙතැයි විශ්වාස කරන්නවුන් නිශ්චිතවම අධෛර්යයට පත් වනු ඇත. තමාගේම ආර්ථික අවශ්‍යතා රැක ගැනීම සඳහා දිග් ගැසුනු උපාමාරුවලින් පසු මේ සියලුම ප්‍රධාන බලයන්, ඉරානයේ න්‍යෂ්ටික වැඩ පිලිවෙලවල් ලෝක සාමයට තර්ජනයක් යැයි ප්‍රකාශ කෙරෙන්නාවූ ද ඒවා වසා දැමීමට අසමත්වීම සම්බන්ධයෙන් ටෙහෙරානය හෙලා දකින්නාවූ ද එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිල යෝජනාවක් පිටු පස ගාල් විය. ඉරාක ආක්‍රමනයට පෙර ක්‍රියා කල ආකාරයෙන්, යෝජනාවේ වචනවල නියතාර්ථය හා නීතිමය සීමා කුමක් වුවද ඉරානයට එරෙහි ප්‍රහාරයක් සාධරනීයකරනය සඳහා මෙම යෝජනාව යොදා ගන්නා බවට කවර සැකයක් හෝ නොමැත. එක්සත් ජාතීන්ගේ සංවිධානය සම්බන්ධයෙන් ගත් කල එහි ඉහල නිලධාරීහු පර්සියානු බොක්කේ එක්සත් ජනපද මිලිටරි වර්ධනයන් හමුවේ පූර්න මුනිවත රකිති.

ඉරානය සමග කෙරෙන යුද්ධයක් මගින් එක්සත් ජනපදය තුල ප්‍රගාඪ දේශපාලනික දූර්විපාක ජනිත කරනු ඇත. බුෂ් පරිපාලනය විසින් නොවැම්බර් මැතිවරනයේ ප්‍රතිඵලය විවෘතවම නොතකා හැරීම ඇමරිකානු මහ ජනතාව සමග වන ගැටුම්කාරී ක්‍රියා දාමයක ස්ථානගත විය. ගැඹුරින්ම අප්‍රසාදයට පත් තම පිලිවෙත්වලට එරෙහිව පැන නගින කවර හෝ විරුද්ධත්වයක් මැඩ පැවැත්වීම සඳහා ධවල මන්දිරය මාන බලන තතු තුල ඉරානයට එල්ල කරන එක්සත් ජනපද ප්‍රහාරයක් රට තුල ප්‍රජාතන්ත්‍රිය අයිතීන්ට එල්ල කෙරෙන බලගතු ප්‍රහාරයක් සමග ඒකාබද්ධ වනු ඇත. කෙසේ නමුදු කොන්ග්‍රසය තුලින් බුෂ්ගේ සැලැසුම්වලට බාධා කිරීමට උත්සාහ කිරීම සම්බන්ධ කරුන ගත් කල සංස්ථාපිත ව්‍යවස්ථාමය ක්‍රියාදාමය තුල එක්සත් ජනපද පරිපාලනය රැඳී සිටිතැයි සහතිකයක් නොමැතග ප්‍රධාන අන දෙන නිලධාරියා ලෙස දිගු කාලීන නීතිමය සහ ප්‍රජාතාන්ත්‍රික සම්මතයන් ඉක්මවා යාමට තමා සතු "අයිතීන්" ගැන බුෂ් නැවත නැවතත් තහවුරු කර තිබේ.

බුෂ් පරිපාලනයේ කෑදර විදේශ පිලිවෙත් සේවය කරනු ලබන්නේ ක්‍රමානුකූල ප්‍රතිව්‍යුහකරනයන්, කප්පාදු කිරීම් සහ පූර්න මූල්‍ය මංකොල්ල මෙහෙයුම් හරහා දැවැන්ත ලාභ පොදි රැස් කර ගන්නා තමා ද අයත් පරපුටු සංගත ප්‍රභූවේ අවශ්‍යතාවලට යි. අන්ත දරිද්‍රතාවයේ නොවේ නම් යන්තමින් දිවි ගැට ගසා ගැනීමට වෙර දරන ජනගහනයේ බහුතරයක් සහ අශික්ෂිත ලෙස ධනවත් වූ අතලොස්සසක් අතර මහා සමාජ අගාධයක් පවතී. එක්සත් ජනපද කම්කරු පංතියේ අවශ්‍යතා රඳා පවත්නේ බුෂ්ගේ යුද සැලසුම්වලට ආධාර කිරීම තුල නොව සාමය, ශීලාචාර ජීවන කොන්දේසි හා මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් අපේක්ෂා කරන ලොව වටා සිටින තමා මෙන්ම වූ මහා ජන සන්නනිපාතයක් තුල ඒකාබද්ධ වීම තුල ය.

ලෝක සමාජවාදී වෙබ් අඩවිය ඉරානයට එරෙහි අධිරාජ්‍යවාදී ආක්‍රමනයටවිරුද්ධ වීම මගින් ඉරාන ජනාධිපති අහ්මඩින්ජාඩ්ගේ ප්‍රතිගාමී පූජකවාදී තන්ත්‍රයට දේශපාලනිකව ආධාර කිරීමක් නො හැගවේ. ඉරාන ආන්ඩුව නියෝජනය කරන්නේ ධනේශ්වර අවශ්‍යතාවන්ගේ අස්ථාවර සභාගයක් වන අතර එය මහජන සහයෝගය මත ලිහිල් ග්‍රහනයක් පවත්වා ගෙන යාම සඳහා ආගමික වාචාලකම් ද ඉඳහිට අධිරාජ්‍ය විරෝධී සටන් පාඨ ද යොදා ගනී. එය සියල්ලටමත් වඩා බියපත් වන්නේ විප්ලවවාදී සමාජවාදී අරගලයන්ගේ ඉතිහාසයක් සතු ඉරාන කම්කරු පංතියේ ස්වාධීන ව්‍යාපාරයක් අලුතින් පැන නගීම සම්බන්ධයෙනි. පූජක තන්ත්‍රයේ මර්ධනකාරී පිලිවෙත් එල්ල කෙරී ඇත්තේ ඉරාන මහජනතාවගේ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී, සමාජවාදී සහ අධිරාජ්‍ය විරෝධී වතපාරයක් මතුව ඒම මැඩ පැවැත්වීමටයි.

නමුදු ඉරාන කම්කරු පංතියේ කර්තව්‍යය වන්නේ ඉරාන ධනේශ්වර තන්ත්‍රය සමග ගනු දෙනු බේරා ගැනීමකි. සත්‍යය වන්නේ, ඉරානය තුලමත් දැවෙන සමාජ අවශ්‍යතාවලින් මහජන අවධානය ඉවතට හැරවීම සඳහා බුෂ්ගේ යුද පෙලඹවීම මගින් අහ්මඩින්ජාඩ් ආන්ඩුවට අවස්ථාවක් සපයා දීමයි. තව දුර පවසතොත්, එක්සත් ජනපදය ඉරානයට එල්ල කරන ප්‍රහාරයක අරමුන වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී තන්ත්‍රයක් නිර්මානය කිරීම නොව තවත් රූකඩ ආන්ඩුවක් ස්ථාපනය කිරීම සහ අර්ධ-විජිතමය ඇමරිකානු වැයික්කියක් බවට රට ඇද දැමීමයි.

## යුද්ධයට එරෙහි සමාජවාදී වැඩ පිලිවෙලක් සඳහා

ඇමරිකානු මිලිටරිවාදයේ පැන නැගීමට එරෙහිව සටන් කල හැකි එකම ක්‍රමය නම් යුද්ධයටත් එහි මූලික ක්‍රියා දාමයන් පදනම්ව පවත්නා ධනේශ්වර පද්ධතියටමත් එරෙහිව ලොව පුරා කම්කරු පංතියේ පුලුල් ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැංවීමයි.

ඉරාකයෙන් සහ ඇෆ්ඝනිස්ථානයෙන් සියලු එක්සත් ජනපද හමුදා වහාම සහ කොන්දේසි විරහිතව ආපසු කැඳවා ගන්නා ලෙසත්, පර්සියානු බොක්කෙන් එක්සත්

ජනපද යුද නැව්වල නාවික සේනාංකයන් ඉවත් කරගන්නා ලෙසත් මැද පෙරදිග හා මධ්‍යම ආසියාව පුරා පෙන්ටගනය විසින් ස්ථාපිත මිලිටරි කඳවුරු ජාලය ගලවා ඉවත් කර ගන්නා ලෙසත් කෙරෙන ඉල්ලීම් වල ආධාරයෙන් කම්කරු පංතියේ ස්වාධීන ශක්තිය බල මුලු ගන්වා ගත යුතු ය.

එක්සත් ජනපද පරිපාලනය තුල සිටින, ඉරාකයට එරෙහි අප්‍රකුපිත ආක්‍රමනකාරී යුද්ධයක් ගෙනයාම සඳහා කරන ලද කුමන්ත්‍රනයට ද බොරු මත පාදක වී දැන් ඉරානයට එරෙහිව තවත් යුද්ධයක් සූදානම් කිරීමට ද වග කිව යුතු සියල්ලන් ඔවුන් විසින් කරන ලද ක්‍රියාවන්ට දේශපාලනිකව හා නීත්‍යානුකූලව වග කිව යුතු බවට කෙරෙන ඉල්ලීමක් ද මතු කල යුතු ය.

ඒ සමගම මෙම යුද්ධයන්හි වෙඩි උන්ඩ ලෙස සේවය කිරීම සඳහා කම්කරු පංතික තරුනයන් යොමු කරවනු වස් හමුදාවට බඳවා ගැනීම පිනිස එක්සත් ජනපදය තුල හෝ අන් ඕනෑම තැනක දැරෙන කවර හෝ ප්‍රයත්නයකට එරෙහිව කම්කරු පංතිය අධිෂ්ඨානශීලීව විරුද්ධ විය යුතු ය.

යුද්ධයට එරෙහි අරගලය යුද්ධය ප්‍රවර්ධනය කරන්නා වූ නිශ්චිත පංති සහ ලාභ අවශ්‍යතාවලට එරෙහිවද යොමු කල යුතු ය. එක්සත් ජනපදය සතු දැවැන්ත මිලිටරි-කර්මාන්ත සංකීර්නය පුද්ගලික හස්තයෙන් මුදවා ගෙන සාමකාමී නිශ්පාදන සඳහා නැවත යොමු කෙරුනු මහජනයාට ප්‍රයෝජනවත් සේවයක් බවට පරිවර්තනය කල යුතු ය. යුද්ධයට වියදම් කරන දැවැන්ත මහජන සම්පත් -- මෙම වර්ෂයට පමනක් පෙන්ටගනයේ අයවැය ඩොලර් බිලියන 470ක් -- එක්සත් ජනපදය තුලත් ජාත්‍යන්තරවත් කම්කරු පංතිය මුහුන දෙන දැවෙන සමාජ ප්‍රශ්න විසඳීම සඳහා ප්‍රති දිශා ගත කල යුතු ය.

ඒ සමානව, ඉරාකය තුල සිදු කරන ලද මරන සහ විනාශයන් හරහා දැවැන්ත ලාභයක් උපයා ගත් එක්සොන්මොබිල්, චෙව්රොන්, කොනොකෝ-ෆිලිප්ස් ආදී සියලු බල ශක්ති සංගතයන් මහජන අයිතියට සහ පාලනයට නතු කල යුතු ය.

ඉරාකයට එරෙහිව නොනවත්වා ගෙන යන යුද්ධය ද ඉරානයට එරෙහි නව සහ වඩාත් ලේ වැකි ප්‍රහාරයක තර්ජනය ද නිමාවකට ගෙන ඒමේ සටන එක්සත් ජනපදය තුල හෝ අන් කවර හෝ රටක පවත්නා මහා ව්‍යාපාරික පක්ෂ සහ රාජ්‍ය ආයතන මගින් ඉදිරියට ගෙන යා නොහැක. මේ සඳහා ජාත්‍යන්තර සමාජවාදී මහජන ව්‍යාපාරයක් ගොඩ නැංවීමේ ඉදිරි දර්ශනය මත පාදකව ලොව පුරා කම්කරු ජනයාගේ අරගලයන් ඒකාබද්ධ කිරීම ආවශ්‍යක වේ. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ පක්ෂ විසින් පවරා ගත් කර්තව්‍යය මෙයයි.

“වාඩි ලා ගැනීම නිමා කොට ඉරාකයෙන් සියලු එක්සත් ජනපද හමුදා ඉවත් කරනුෟ ඉරානයට එරෙහි යුද්ධය එපාෟ” යන සටන් පාඨය යටතේ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ :සසජාශි* සහ සමාජවාදී සමානතා පක්ෂය :සසප* එක්සත් ජනපදය තුල කැඳවා ඇති හදිසි සමුලුවට ලෝක සමාජවාදී වෙබ් අඩවිය බලගතු ලෙස සහයෝගය දක්වයි.

මිචිගන් ප්‍රාන්තයේ ඈන් ආර්බර් හි පිහිටි මිචිගන් සරසවිය තුල මාර්තු 31 දා සහ අප්‍රේල් 1 දා පැවැත්වීමට නියමිත මෙම සමුලුව අධිරාජ්‍යවාදී යුද්ධයටත් එය නිර්මානය කරනු ලබන ධනේශ්වර පද්ධතියටත් එරෙහිව එක්සත් ජනපද සහ ජාත්‍යන්තර ශිෂ්‍ය-ශිෂ්‍යාවන්, තරුන-තරුනියන් සහ කම්කරු ජනතාව බල මුලු ගැන්වීම සඳහා සේවය කරන අත්‍යවශ්‍ය සංසදයක් වනු ඇත.

© www.wsws.org